**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2022-06-07

පැමිණිලි පාර්ශවය : ඩී.එල්.ඩී. නදීක මයා,
දර්ශන ස්ටෝර්ස්,
නො 145/ඒ, පොලීසිය අසල,
එපිටවල, කිරිඇල්ල.

පැමිණිලි පාර්ශවය : 01 විදුහල්පති,
ෆර්ගසන් උසස් බාලිකා විද්‍යාලය,
රත්නපුර.

02 අධ්‍යක්ෂ (ජාතික පාසැල් ශාඛාව),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : **HRC/1323/18**</u>

**පැමිණිලි පාර්ශවයේ කරුණු සැළ කිරීම =:**

උක්ත පැමිණිලිකරු විසින් 2018 ජූනි මස 04 දාතමින් ඉදිරිපත් කරන තම මුල් පැමිණිල්ල සහ ඉන් පසුව ඉදිරිපත් කර ඇති අනෙකුත් පැමිණිල්ලට අදාළ ලේඛන මගින් ප්‍රකාශ කර ඇත්තේ, තම දියණිය 2018 වසරේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සඳහා 'ක්‍රියාන්විත පදනම' යටතේ රත්නපුර ෆර්ගසන් උසස් බාලිකා විදුහල වෙත අයදුම් පත්‍රයක් යොමු කරන ලද බවයි. ඒ අනුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ED/1/6/5 අංක දරණ 2018-01-05 දිනැති ලිපිය පරිදි නිර්දේශයක් ලැබී තිබූ බවත්, ඒ අනුව ෆර්ගසන් උසස් විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් තම දියණිය එම වසරේ පළමු ශ්‍රේණියට ක්‍රියාන්විත ගණය යටතේ ඇතුලත් කර නොගැනීම මගින් තම මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවට පැමිණිල්ලෙන් සඳහන් කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் : 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் : 011-2505451
ෆැක්ස් / தொலைநகல் : 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் : sechrcsl@gmail.com

වගඋත්තරකාර පාර්ශවයන්ගේ කරුණු දැක්වීම් =:

01 විදුහල්පතිනි, ෆර්ගසන් උසස් බාලිකා විදුහල, රත්නපුර කරුණු දැක්වීම

මෙම පැමිණිල්ලට අදාළව 2018-06-12 දාතමින් වර්තා කැඳවීමක් සිදු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් 2018-07-10 දාතමින් ලිඛිතව පිළිතුරු ලබාදී ඇති විදුහල්පතිනි ප්‍රකාශ කර ඇත්තේ තම පාසලේ පළමු ශ්‍රේණිය සඳහා 2018 වසරේ ක්‍රියාත්විත පදනම මත දරුවන් 28 දෙනෙකුගේ නම් ඇතුළත් අනුමත ලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් යුතුව 2017-11-16 දිනැතිව තමා වෙත එවා තිබූ බවත්, ඒ අනුව එම සියලුම දරුවන් 2018-01-07 පාසලට ඇතුළත් කර ගැනීමට කටයුතු කර ඇති බවත්ය.

තවද එම ලේඛනයේ නාවික හමුදාව යටතේ පුරප්පාඩු දෙකක් පැවති බවත්, අධ්‍යාපන ලේකම් විසින් 2017-12-06 දිනැතිව තමා වෙත යොමු කර තිබූ පොරොත්තු ලේඛනය අනුව එම පුරප්පාඩු පිරවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 22/2017 චක්‍රලේඛයේ පරිච්ඡේද 13 සහ 14 අනුව කටයුතු කර ඇති බවත් පවසන අතර එම පොරොත්තු ලේඛනයේ පිළිවෙලින් අංක 01 සහ 02 යටතේ වූ දරුවන් ඇතුළත් කිරීමට කැඳවීම් සිදුකරන ලද බවත් අංක 02 යටතේ වූ දරුවා ආදි ශිෂ්‍ය ගණය යටතේ මෙම විද්‍යාලයට ඇතුළත් කර තිබූ බැවින් පොරොත්තු ලේඛනයේ සඳහන් අංක 03 දරුවා කැඳවීම් කරන ලද බවත්, ඒ අනුව පොරොත්තු ලේඛනයේ අංක 01 හා 03 යටතේ වූ දරුවන් ඇතුළත් කිරීම සිදුකරන ලද බවත් දක්වා ඇත. එමෙන්ම උක්ත පැමිණිලිකාර ඩී.එල්.ඩී. නදික මහතාගේ නම මෙම පොරොත්තු ලේඛනයේ ගුවන් හමුදා ගණය යටතේ අංක 05 හි සඳහන් වී ඇති බවද දක්වා ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/1/6/5/1/ක්‍රි.වි.2018 හා 2018-01-05 දිනැති ලිපියෙන් ඩී.එල්ඩී නදික මහතාගේ දරුවා ඇතුළත් කිරීම අනුමත කර තිබුණද අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 22/2017 හි පරිච්ඡේද 13 හා 14 අනුව පොරොත්තු ලේඛනයේ නාවික හමුදා ගණය යටතේ සිටින දරුවන් හට ප්‍රමුඛතාවය ලබා දියයුතු බව කිහිප වතාවක්ම පැමිණිලිකරු වෙත පැහැදිලි කර දුන් බවද අදාළ වාර්තාව මගින් ප්‍රකාශ කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/1/6/5/1/ක්‍රි.වි.2018 හා 2018-01-29 දිනැති ලිපියෙන් යුධ හමුදා ගණය යටතේ ඉල්ලුම් කරන ලද එච්.ටී. ප්‍රේමසිරි පෙරේරා මහතාගේ දරුවාගේ ඇතුළත් කිරීම අනුමත කර එවා තිබූ අතර ජාතික පාසැල් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමත ලිපියේ සඳහන් වූ සටහන අනුව දරුවා 2018-02-27 දින ඇතුළත් කරන ලද බවත්, ඒ අනුව උක්ත පැමිණිලිකරු වන ඩී.එල්.ඩී. නදික මහතා හට ද ලිපියක් මගින් දරුවා ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට විද්‍යාලයීය කාර්යාලයට පැමිණෙන ලෙස දන්වා යවා ඇති බවත්, මෙම වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාව දක්වාම ඔහු ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමක් සිදු කර නොමැති බවත් දන්වා ඇත.

තවද මේ පිළිබඳව දුරකථන ඇමතුමක් මගින් ද දැනුවත් කර ඇති අතර, එහිදී තම දරුවා වෙනත් පාසලකට ඇතුලත් කර ඇති බව හා එබැවින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවට එම අවස්ථාවේදී ඔහු විසින් දැනුම් දෙන ලද බවද අදාල වාර්තාව මගින් අවසන් වශයෙන් ප්‍රකාශ කර ඇත

**අධ්‍යක්ෂ, ජාතික පාසැල් අධ්‍යාපන අමාත්‍යාංශය කරුණු දැක්වීම =:**

ජාතික පාසැල් අධ්‍යක්ෂ වෙනුවෙන් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ නීතිඥ ප්‍රදීප් නිශාන්ත මහතා ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිල්ලේ විෂයගත කාරණය සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පැමිණිලිකරුගේ දියණිය ෆර්ගසන් උසස් බාලිකා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සඳහා ලිපියක් නිකුත් කර ඇති බව අනාවරණය වී ඇති බවත්, කෙසේ වෙතත් ඒ අනුව කටයුතු නොකිරීම සම්බන්ධව විදුහල්පතිනිය විසින් ඉදිරිපත් කරන කාරණා ද පිළිගත හැකි සාධාරණ කාරණා බැවින් ඒ සම්බන්ධයෙන් ද අවධානය යොමු කලයුතු බවත්ය.

**විමර්ශනය =:**

විදුහල්පතිනි, ෆර්ගසන් උසස් බාලිකා විදුහල, රත්නපුර මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ සිදුකරන ලද කරුණු දැක්වීම අනුව පැමිණිලිකරුගේ දියණිය 2018 වසරේ තම පාසලේ පළමු ශ්‍රේණිය සඳහා ඇතුලත් කර ගැනීමට අදාලව ක්‍රියාත්මක රාජකාරි ගණය යටතේ සලකා බැලීමේදී තමන් ඇතුළු පාසැල් පරිපාලනය නීත්‍යානුකූලව කටයුතු කර ඇති බවත්, ඒ අනුව පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් තමන් කටයුතු කර නොමැති බවත්ය.

තවද පළමු වගඋත්තරකරු ලෙස විදුහල්පතිනි, ෆර්ගසන් උසස් බාලිකා විද්‍යාලය විසින් 2018-07-10 දාතමින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ලිඛිත කරුණු දැක්වීම සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවය විසින් ලබාදී ඇති නිරීක්ෂණ පිළිබඳව නැවත වතාවක් කොමිෂන් සභාවේ දැන්වීම පරිදි විදුහල්පතිනියගේ නිරීක්ෂණ 2018-10-30 දාතමින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇත. එම කරුණු දැක්වීම මගින්ද විදුහල්පතිනිය ප්‍රකාශ කර ඇත්තේ, පෙර පරීක්ෂණ අවස්ථා වලදී ඉදිරිපත් කළ කරුණු දැක්වීම වේ.

කෙසේ වෙතත් මෙම පැමිණිල්ල සම්බන්ධව වැඩිදුර විමර්ශනයේදී පැමිණිලි පාර්ශවය ඇතුළු වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත හා වාචික කරුණු දැක්වීම් කෙරෙහි අවධානය යොමු කිරීමේදී විශේෂ අවධානය යොමු වියයුතු කාරණය වන්නේ පැමිණිලිකරුගේ දියණිය 2018 වසරේ රත්නපුර ෆර්ගසන් උසස් බාලිකා විදුහලේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සම්බන්ධයෙන් ජාතික පාසැල් අධ්‍යක්ෂවරයා විසින් ලබාදී ඇති ලිඛිත උපදෙස් පරිදි විදුහල්පතිනිය කටයුතු කර ඇත්ද යන්නයි. එවැනි ලිඛිත උපදෙසක් ලැබී ඇති බවත්, ඒ අනුව පැමිණිලිකරු වන නදීක මහතා වෙත ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට පැමිණෙන ලෙස ලිඛිතව සහ දුරකථනය

මගින් දන්වා ඇති බව වැඩිදුර විමර්ශනයේදී විදුහල්පතිනිය ප්‍රකාශ කර තිබීම යන කාරණය වැඩිදුරටත් සලකා බැලිය යුතුය. පාසල මගින් පැමිණිලිකරු වෙත සිදු කර ඇති එම දැන්වීම් වලට ප්‍රතිචාර ලෙස විශේෂයෙන් දුරකථනයෙන් සිදු කළ දැන්වීමේදී දරුවා වෙනත් පාසලකට ඇතුලත් කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් පැමිණිලිකරු උනන්දු නොවන බව සඳහන් කළ බවට වන කාරණය ද මෙහිදී වැදගත් කොට සැලකිය යුතු වේ.

කෙසේ වෙතත් පැමිණිලිකරු පාසල මගින් එවැනි දැන්වීම් තමන් වෙත සිදු කර නොමැති බව ප්‍රකාශ කර ඇත. තවද විදුහල්පතිනියගේ ලිඛිත හා වාචික කරුණු දැක්වීම් වලට පිළිතුරු වශයෙන් 2018-09-24 දාතමින් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති තම නිරීක්ෂණ මගින් පෙන්වා දෙන පරිදි තම දියණිය පාසලට ඇතුලත් කර ගැනීම සඳහා සාකච්ඡා කිරීමට පැමිණෙන ලෙස කැඳවීම් ලිපියක් හෝ දුරකථන ඇමතුමක් ලබාදී ඇත්නම් ඒ සම්බන්ධව පිළිගත හැකි සාක්ෂි ඔවුන් සතුව තිබිය යුතු බවට පැමිණිලිකරු ඉදිරිපත් කරන තර්කයද මෙහිදී වැදගත් කොට සැලකිය යුතුය. ඒ අනුව මෙ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයේදී පරීක්ෂණ නිලධාරී විසින් විදුහල්පතිනිය වෙත දන්වා ඇති පරිදි 2019-02-26 දාතමින් අදාළ ලිපියේ පිටපතක් යොමු කර ඇති අතර, 2018-03-02 දිනැතිව පැමිණිලිකරු වෙත විදුහල්පතිනිය විසින් ලිඛිත දැන්වීමක් යොමු කර ඇති බව සඳහන් කර ඇතත්, එම ලිපිය කොතෙක් දුරට සත්‍ය ලිපියක් ද යන්න පිළිබඳ ගැටළු මතු කරයි. දුරකථන ඇමතුමක් ලබාදී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට විදුහල්පතිනිය හෝ පාසැල් පරිපාලනය අපොහොසත් වී ඇති බව ද නිරීක්ෂණය වේ.

2018 වසරේ රජයේ පාසල් වල පළමු ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 22/2017 චක්‍රලේඛයේ 12.5 සහ 12.6 වගන්ති කෙරෙහි අවධානය යොමු කිරීමේදී එමගින් අදාළ විදුහල්පතිවරුන් වෙත උපදෙස් ලබාදී ඇත්තේ, සම්මුඛ පරීක්ෂණ සහ අභියාචනා විරෝධතා පරීක්ෂාවෙන් පසුව තෝරා ගත් සිසුන් මෙන්ම තෝරා නොගත් සිසුන් සම්බන්ධයෙන් අදාළ අයදුම්කරුවන් වෙත දැන්වීම් සිදු කළයුතු බවයි. මෙම පැමිණිල්ලේ වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු අනුව පැමිණිලිකරුගේ දියණිය ෆර්ගසන් උසස් බාලිකා විදුහලේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමට අදාළව විදුහල්පතිනියගේ අත්සනින් යුතුව යොමු කර ඇති බව සඳහන් ලිපිය පාසලේ ලිපි ශීර්ෂයෙන් යොමු කර නොමැති බවද නිරීක්ෂණය වන අතර, එය ලියාපදිංචි තැපැල් මගින් යොමු කර ඇත්ද යන්න සනාථ කිරීම සඳහාද ෆර්ගසන් උසස් බාලිකා විදුහල අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය =:**

මෙම පැමිණිල්ලට අදාළව සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු අනුව පළමු වගඋත්තරකරු ලෙස නම් කර ඇති විදුහල්පතිනි, එම්. ගලගම මිය, ෆර්ගසන් බාලිකා විදුහල, රත්නපුර විසින් පැමිණිලිකරුගේ දියණිය ක්‍රියාත්මක ගණය යටතේ 2018 වසරේ පළමු

ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශය නිර්දේශ කර තිබියදී සහ ඊට අදාළ එම වසර සඳහා රජයේ පාසල් වල පළමු ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුලත් කර ගැනීමට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 22/2017 චක්‍රලේඛයේ ප්‍රතිපාදන නිසි පරිදි අනුගමනය කරමින් මෙම විෂයගත කාරණයේදී කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වන අතර. එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය =:**

ඒ අනුව පැමිණිලිකරුගේ දියණිය රත්නපුර ෆර්ගසන් උසස් බාලිකා විද්‍යාලයේ නියමිත ශ්‍රේණියකට ඇතුලත් කර ගැනීමට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අධ්‍යක්ෂ, ජාතික පාසැල් හා මගින් විදුහල්පතිනි ෆර්ගසන් උසස් බාලිකා විද්‍යාලය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.07.06 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික) ,
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ. නිමල් කරුණාසිරි
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

B/-